# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2204/3 - 2020 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2020.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 10/3/1/3/76.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2018/WS/48.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ රත්තොට ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, මාඋස්සාගොල්ල ග්‍රාම නිලධාරී වසමේ, මාඋස්සාගොල්ල ගමේ පිහිටි මාතලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කරන ලද මා1824 හා 2020.09.16 දිනැති මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: අස්වැද්දුමේ වත්ත, තැන්නේයාය වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය : ඩී. ජී. පී. සමරනායක සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0681

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: අස්වැද්දුමේ වත්ත, තැන්නේයාය වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය : ඩී. ජී. පී. සමරනායක සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0531

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2020 දෙසැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.00 ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 දෙසැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එම්. එන්. දිනිප්‍රිය,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

2020 නොවැම්බර් මස 12 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-211